**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික "අධිකාරියේ" 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ මුද්‍රිත හා විද්‍යුත් සන්නිවේදන මෙවලම් සැකසීමේ කාර්යයන් සඳහා අධිකාරිය විසින් සැලසිනේ ටෙලිවිෂන් ඉන්ස්ටියුට් ආයතනය සමඟ ඇතිකරගෙන තිබුණු ගිවිසුම ප්‍රකාරව ගෙවා තිබුණු අත්තිකාරම් මුදල වූ රු. 8,676,039 ක් අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 8,676,039 අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2018 වර්ෂයට අදාලව ගිවිසුම් ප්‍රකාරව අදාල කාර්යයන් සැලසිනේ ආයතනය විසින් සිදු කළ යුතු වීමත් 2019 වර්ෂය සඳහා සම්මත වූ අතුරු සම්මත ගිණුම යටතේ ප්‍රතිපාදන මෙම වැඩසටහන යටතේ නැවත වෙන් කරවා ගැනීම ඉතා අපහසු කාර්යයක් වූ නිසාත්, 2018.12.31 දිනට මුදල් පොත පියවා ඉතිරි මුදල් නැවත අමාත්‍යාංශය වෙත බැර කිරීමට සිදු වීම නිසාත් රු. 8,676,039.00 ක මුදල වියදමක් ලෙස ගිණුම් ගත කිරීමට සිදු විය. අධිකාරිය වෙත ලබා දිය යුතු නිෂ්පාදනයන් පිරිවිතරයන්ට ගැලපෙන ලෙස අදාල සංශෝධනයන්ට යටත්ව නිවැරදි ආකාරයෙන් නිවැරදි ප්‍රමාණයෙන් ලැබී ඇති බවට වන නිර්දේශයන් මත ඉහත චෙක්පත සැලසිනේ ආයතනය වෙත ලබා දීම සිදු කිරීමට කළමනාකරණය විසින් තීරණය කරන ලදි. ඒ අනුව 2019.05.24 වන දින ගිවිසුම් ප්‍රකාරව අදාල පිරිවිතරයන්ට අනුකූලව වීඩියෝ පට හා රේඩියෝ හඬ පට අධිකාරිය වෙත ලබා දීමට සැලසිනේ ආයතන විසින් කටයුතු කර තිබුණි. එමෙන්ම 2019.06.06 දින අවසන් පෝස්ටර් පත්‍රිකා ප්‍රමාණය ද අධිකාරිය වෙත ලැබුණි. ඒ අනුව රු. 6,073,227.33 ක් වටිනා අංක 664292 දරන චෙක්පත අවලංගු කර 10% ක රඳවා ගැනීමකට යටත්ව නැවත නිකුත් කිරීමට අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කළ යුතුවේ. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අධිකාරිය හා සැලසිනේ ටෙලිවිෂන් ඉන්ස්ටියුට් ආයතනය සමඟ 2018 නොවැම්බර් 28 දින ඇති කර ගන්නා ලද වැඩ හා සේවා ගිවිසුම 5 වන වගන්තිය | මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන - 2018 ට අදාලව මුද්‍රිත හා විද්‍යුත් සන්නිවේදන මෙවලම් සැකසීමේ කාර්යන් සඳහා වූ නව ගිවිසුමේ 6 වගන්තිය ප්‍රකාරව නිර්මාණ භාර නොගෙන මුළු මුදල වූ රු. 8,676,039 ක් ගෙවීම | 2019 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා සම්මත වූ අතුරු සම්මත ගිණුම හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සඳහා ද රේඛීය අමාත්‍යාංශය විසින් 2018 වර්ෂය වෙනුවෙන් අක්මුදල් නිදහස් කරනු ලැබුවේ මු.රෙ. 371 ප්‍රකාරව අතුරු අග්‍රිමයක් ලෙසය. ඒ අනුව ඉදිරි වර්ෂය සඳහා මුදල් පොතේ ශේෂය ඉදිරියට ගෙන යාම සිදු කළ නොහැකි වීම සහ 2019 ජනවාරි සිට අප්‍රේල් දක්වා සම්මත වූ අතුරු සම්මත ගිණුම හේතුවෙන් ඉහත වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම සිදු කළ නොහැකි බව භාණ්ඩාගාරය විසින් සිදු කළ දැනුම් දීම මත එම වැඩසටහන් සඳහා ගෙවීම් ගැටළු සහගත විය. ඒ අනුව මූලික ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ගිවිසුම් ප්‍රකාරව සැලසිනේ ආයතනය සමඟ කටයුතු කිරීම ඒ වන විටද ආරම්භ කර තිබූ හෙයින් 30% ක අත්තිකාරම් මුදලක් ගෙවා ඉතිරි 70% ක මුදල සඳහා ද චෙක්පතක් නිකුත් කිරීමට කටයුතු කිරීමට සිදු විය.<br>නමුත් ගිවිසුම් ප්‍රකාරව අධිකාරිය වෙත ලබා දිය යුතු නිෂ්පාදනයන් පිරිවිතරයන්ට ගැලපෙන ලෙස අදාල සංශෝධනයන්ට යටත්ව නිවැරදි ආකාරයෙන් නිවැරදි ප්‍රමාණයෙන් ලැබී ඇති බවට වන නිර්දේශයන් මත ඉහත චෙක්පත සැලසිනේ ආයතනය වෙත ලබා දීම සිදු කිරීමට කළමනාකරණය විසින් තීරණය කරන ලදි. ඒ අනුව 2019.05.24 වන දින ගිවිසුම් ප්‍රකාරව අදාල පිරිවිතරයන්ට අනුකූලව වීඩියෝ පට හා රේඩියෝ හඬ පට අධිකාරිය වෙත ලබා දීමට සැලසිනේ ආයතනය විසින් කටයුතු කර තිබුණි. එමෙන්ම 2019.06.06 දින අවසන් පෝස්ටර් පත්‍රිකා ප්‍රමාණය ද අධිකාරිය වෙත ලැබුණි. ඒ අනුව රු. 6,073,227.33 ක් වටිනා අංක 664292 දරණ චෙක්පත අවලංගු කර 10% ක රඳවා ගැනීමකට යටත්ව නැවත නිකුත් කිරීමට අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ. | වැඩ හා සේවා ගිවිසුමට අනුකූල විය යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 487,801 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ (2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාලච්ඡේදය සඳහා) අතිරික්තයක් හෝ ඌනතාවයක් නොවිය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.487,801 ක අතිරික්තයක් ඇති වීමට වෙනත් ආදායම්වල වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා අධිකාරියේ කාර්යසාධන වාර්තාවට අනුව නීති හා නීති බලාත්මක කිරීමේ අංශය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද සමස්ථ පැමිණිලි සංඛ්‍යාව 86 ක් විය. සමාලෝචිත වර්ෂයේ අධිකාරිය විසින් විමර්ශනය අවසන් කර වසා දැමූ පැමිණිලි සංඛ්‍යාව 23 ක් වන අතර විමර්ශනයන් සිදු කරමින් පවතින පැමිණිලි සංඛ්‍යාව 38 ක් විය. වසා දමා හෝ වෙනත් ආයතන වලට යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව 19 ක් වූ අතර ආරක්ෂාව සපයමින් පැවැති පැමිණිලි 5 ක් හා බහා තැබූ පැමිණිලි 4 ක්ද විය. අධිකාරිය මෙතෙක් ආරක්ෂක අංශයක් හෝ සහායක අංශයක් ස්ථාපිත කර නොතිබුණ හෙයින් "ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවගේ සහායක හා ආරක්ෂක කොට්ඨාසය" වෙත අධිකාරිය වෙත ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 30 ක් එනම් සියයට 35 ක ප්‍රතිශතයක් යොමු කර තිබුණි. | අධිකාරිය 2018 වර්ෂය තුළ ලැබුණු සමස්ථ පැමිණිලි සංඛ්‍යාව සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගෙන ඇති පියවරට අදාළව විගණන නිරීක්ෂණයේ නිර්දේශය වන්නේ අධිකාරියේ ආරක්ෂණ හා සහාය අංශ කඩිනමින් ස්ථාපනය කළ යුතු බවයි.<br>කෙසේ වුවද, අධිකාරියේ ආරක්ෂණ හා සහාය අංශයේ අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීමට ප්‍රමාද වූයේ එම අංශවල අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මෙතෙක් ලැබී නොමැති බැවිනි. | අධිකාරියේ ආරක්ෂක අංශය හා සහය අංශය කඩිනමින් ස්ථාපිත කල යුතුවේ. |
| (ඇ) අධිකාරිය දැනට පවත්වාගෙන යන ගොඩනැගිල්ල අධිකරණ අමාත්‍යාංශය සතුව පැවති අතර එහි විදුලිය, ජලය වැනි නඩත්තු වියදම් අධිකරණ අමාත්‍යාංශය යටතේ දරනු ලබයි. විධිමත් පරිදි අධිකාරිය වෙත පැවරීමක් සිදු කර නොමැති ගොඩනැගිල්ලේ කාර්යාල පරිශ්‍රය සකස් කිරීමේ දී අභ්‍යන්තර වෙන් කිරීම් (Partition) සඳහා රු. 1,991,278 ක මුදලක් අධිකාරිය විසින් වියදම් කර තිබුණි. මෙකී ප්‍රාග්ධන වියදම මඟින් ලැබිය යුතු ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වීම පිළිබඳව තහවුරුවක් ලබා ගැනීම සඳහා අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | දැනට ජාතික අධිකාරිය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල අධිකරණ අමාත්‍යාංශය සතු ගොඩනැගිල්ලක් වුවද 2016 ජනවාරි 08 දින, 428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයෙහි ස්ථාපිත කරන ලද බව එවකට ගරු අධිකරණ අමාත්‍ය තුමන්, නියෝජ්‍ය ඇමතිතුමන් සහ එවකට සිටි අමාත්‍යාංශ ලේකම් තුමන් විසින් ප්‍රකාශ කර ඇත. තවද මේ පිළිබඳව වැඩිදුරටත් තහහුරුවක් ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අදාල තහවුරු කිරීම් කඩිනමින් ලබාගෙන නිරවුල් කිරීම විධිමත් පරිදි සිදු කල යුතුවේ. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන (UNDP) ව්‍යාපෘතිය යටතේ අධිකාරිය වෙත ලැබී තිබුණ එකතු වටිනාකම රු. 410,363 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රය සහ මුද්‍රණ යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ සහය හා රැකවරණ බඳවා ගැනීම සඳහා 2017 හා 2018 වර්ෂයන්හි අවස්ථා කිහිපයකදීම සම්මුඛ පරීක්ෂණ පැවැත්වූව ද, සුදුසුකම් ලත් අයදුම්කරුවන් නොසිටි බැවින් බඳවා ගැනීම සිදු කිරීමට නොහැකි විය. නමුත් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යටතේ අදාල ICT උපකරණ මිල දී ගැනීමේ අවශ්‍යතාවය ඉහත තනතුරු සඳහා වන බඳවා ගැනිමට නියමිත නිලධාරීන් ද ඇතුළුව දක්වා යැවීම හේතුවෙන් ඡායා පිටපත් යන්ත්‍ර 07 ක් හා මුද්‍රණ යන්ත්‍ර 07 ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් අධිකාරිය වෙත ලබා දෙන ලදි. එමෙන්ම වර්තමානයේ ඉහත තනතුර අධ්‍යක්ෂ (සහය සේවා) හා අධ්‍යක්ෂ (රැකවරණ) ලෙස තනතුරු දෙකක් වශයෙන් ස්ථාපිත කිරීමට 2019.02.14 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර එම තනතුරු දෙක සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුමැතිය සඳහා 2019.05.13 දින එම දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.<br>ඒ අනුව ඉදිරියේ දී අදාල තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම කඩිනමින් සිදු කිරීමට අධිකාරිය විසින් කටයුතු සිදු කරමින් පවතී. | පුරප්පාඩු පිරවීමට අදාල කටයුතු කඩිනමින් සිදු කර ආයතනයේ සැබෑ අවශ්‍යතාවයන් හඳුනා ඒ අනුව ඉල්ලීම් කර වත්කම් මිලදී ගැනීමට කටයුතු කළ යුතුවේ. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අනුමත ප්‍රසම්පාදන සැලැස්මේ වායු සමීකරණ යන්ත්‍ර 05 ක් මිලදී ගැනීමට සැලසුම සකස් කර තිබුණ ද එකී සැලැස්මෙන් බැහැරව වායු සමීකරණ යන්ත්‍ර 06 ක් රු. 540,000 කට මිල දී ගෙන තිබූ අතර තවත් යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේ දී එක් වායු සමීකරණ යන්ත්‍රයක් රු. 310,000 බැගින් වන ලෙස ඇස්තමේන්තු සකස් කර තිබුණද මිල කැඳවීමේ දී | සමාලෝචිත වර්ෂය සඳහා මිළ දී ගැනීමට ඇස්තමේන්තුගත කර තිබුණේ වායුසමීකරණ යන්ත්‍ර 05 වුවත් ආයතනික කාර්යමණ්ඩලය වර්ධනය වීම හා කාර්යාල පිරිසැකැස්ම සැලසුම් කිරීමත් සමග වායුසමීකරණ යන්ත්‍රවල අවශ්‍යතාවය ඇතිවූ හෙයින් 06 ක් මිළ දී ගැනීමට සහ අමතර වායුසමීකරණ යන්ත්‍රයක් ද මිළ දී ගැනීමේ අවශ්‍යතාවය මතු විය.<br>2018 ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේ දී වායුසමීකරණ යන්ත්‍ර මිළ දී ගැනීම වෙනුවෙන් එක් යන්ත්‍රයක් සඳහා ඇස්තකමේන්තු ගත මුදල රු. 310,000 ක් වුවත් මිළ දී ගැනීමේ දී එක් යන්ත්‍රයක් වෙනුවෙන් වියදම් වී ඇති මුදල රු. 100,000 කට වඩා අඩු බව සඳහන් කර තිබිණි. මෙම අධිකාරිය තුළ ඉංජිනේරුමය දැනුමක් ඇති නිලධාරීන් නොමැති අතර එම අවශ්‍යතාවය අනුව වායුසමීකරණ යන්ත්‍රයක් වෙනුවෙන් යන වියදම පිළිබඳව නිශ්චිතව කිව | ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව අනුමත ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීමේදී මූලිකවම ආයතනයේ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ අනුව සැලසුම් සකස් කළ යුතුවේ.<br><br>ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා |

| | | |
|---|---|---|
| සියළුම ආයතන විසින් රු. 100,000 කට වඩා අඩු මිල ගනන් ඉදිරිපත් කර තිබූ අතර අධිකාරිය ඇස්තමේන්තු සකස් කිරීමේ දී අධි අතාත්වික ඇස්තමේන්තු සකස් කිරීම නිසා අය වැය ඵලදායී ලෙස උපයෝජනය කර නොතිබුණි.<br>වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීමේ දී පිරිවිතර නිසියාකාරව සකස් නොකිරීම නිසා මිලට ගැනුම් පිරිවැයට අමතරව සවිකිරීම් සඳහා රු. 105,050 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | නොහැකි වූ බැවින් අධි අතාත්වික ඇස්තමේන්තුගත කිරීමක් බවට පත්වී ඇත. එහෙත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමෙන් අනතුරුව නිවැරදි තාක්ෂණික දැනුම යොදාගත හැකි වූ නිසා නිවැරදි ගණනය කිරීම් සිදුකර ගැනීමට හැකි වූයෙන් වියදම අඩුවී ඇත. ඇස්තමේන්තුගත මුදලට වඩා අඩු මුදලක් වැය වී ඇති බැවින් ආයතනයට පාඩුවක් සිදුවී නොමැති අතර මින් ඉදිරියට එවන් අතපසු වීම් මගහරවා ගැනීමට කටයුතු කරනු ඇත.<br>වායුසමීකරණ යන්ත්‍ර මිළ දී ගැනීමට පිරිවිතර සකස් කිරීමේ දී සවි කිරීමේ ගාස්තු පිළිබඳව අවධානය යොමු කර නොමැත. එහෙත් එම යන්ත්‍ර සවි කිරීමේ දී අතිරේකව විදුලිය සපයා ගැනීමට සිදුවූ හෙයින් වායුසමීකරණ යන්ත්‍ර මිළ දී ගත් ආයතනය මගින්ම ඇස්තමේන්තුවක් ලබාගෙන අදාළ සේවාවන් සපයා ගැනීමට සිදුවිය. මිළ දී ගත් වායුසමීකරණ යන්ත්‍ර අනිවාර්යයයෙන්ම සවි කළ යුතු අතර එම ආයතනයෙන්ම සවිකර ගැනීමට අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට තීරණය කර ඇත. | තාක්ෂණික ඇගයීම් කමිටුවකින් පිරිවිතරයන් පිළිබඳව නිර්දේශ ලබාගෙන ඒ අනුව මිල කැඳවීම් කළයුතු අතර ඇස්තමේන්තු සකස් කිරීම තාත්විකව කළ යුතුවේ. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 54 ක් වූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ පැවති තනතුරු සංඛ්‍යාව 31ක් විය. ආයතනයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම බලපාන තනතුරු 23 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් තවදුරටත් පුරප්පාඩුව පැවතුණි. | 2018.12.31 දිනට තථ්‍ය කාර්යමණ්ඩලය 31කි. පුරප්පාඩු සංඛ්‍යාව 23 කි. මේවන විට පුරප්පාඩු සංඛාව 21 ක් වේ. එය අනුමත කාර්යමණ්ඩලයෙන් ප්‍රතිශතයක් ලෙස 38% වේ.මේවන විට තථ්‍ය කාර්යමණ්ඩලය 34 වන අතර පුරප්පාඩු සංඛ්‍යාව 21 කි. අභ්‍යන්තර විගණන නිලධාරී සහ නීති නිලධාරීන් දෙදෙනා මේවන විටත් බඳවාගෙන ඇති අතර තොරතුරු නිලධාරී බඳවා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණ 2019.06.17 සහ 18 දෙදින පැවැත්වීමට නියමිතය. තවද විමර්ශන නිලධාරී, සන්නිවේදන නිලධාරී සහ භාෂා පරිවර්තක යන තනතුරු වලට බඳවා ගැනීම සඳහා වන පුවත්පත් දැන්වීම් 2019.05.26 දින පලකරන ලදී.<br>✓ 2019 වර්ෂය සඳහා අයවැය අනුමත වීම ප්‍රමාද වීමත් සමග බඳවා ගැනීම් ප්‍රමාද වීම.<br>✓ පැවැති අස්ථාවර දේශපාලන වටපිටාව තුළ බවා ගැනීම් නවතා දැමීමට සිදුවීම.<br>✓ සුපරීක්ෂක මට්ටමේ තනතුරු පුරප්පාඩුව පවතින අවස්ථාවක අනෙකුත් සේවකයින් බඳවා ගැනීම තුළ රාජකාරී පැවරීමේ ගැටළු මතුවීමට ඇති ඉඩකඩ වැඩිවීම | කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම බලපාන තනතුරුවල පුරප්පාඩු පැවතීම ආයතනයේ අරමුණු හා බැඳුනු කාර්යභාරය විධිමත්ව ඉටු කිරීමට බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. |